# පටුන


| | |
|---|---|
| ක්ෂණික යොමුව | 2 |
| දැක්ම | 3 |
| මෙහෙවර | 4 |
| අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය | 5 |
| කළමනාකරණ මණ්ඩලය | 7 |
| කාර්ය මණ්ඩලය | 8 |
| මානව සම්පත් සංවර්ධනය | 8 |
| උපාධි ප්‍රදානෝත්සවය | 11 |
| බාහිර කථිකාචාර්ය මණ්ඩලය | 11 |
| පර්යේෂණ සම්මන්ත්‍රණ | 12 |
| බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය | 14 |
| අධ්‍යයන කාර්යමණ්ඩලයේ පර්යේෂණ දායකත්වය | 15 |
| බාහිර ආයතන වල කම්ටු සාමාජිකත්වය | 16 |
| පාඨමාලා නිබන්ධ ලැයිස්තු | 21 |
| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 28 |
| විගණන වාර්තා | 29 |
| විගණකාධිපති වාර්තාව 2015 | 33 |

# දැක්ම

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ
ක්ෂේත්‍රයේ දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ හා
ව්‍යවසායකත්වය අතර
මනා සම්බන්ධතාවක් ගොඩ නංවමින්
ජාත්‍යන්තර වශයෙන්
කීර්තිමත් විශිෂ්ටත්වයේ
මධ්‍යස්ඵානයක් බවට පත් වීම.

## මෙහෙවර

ජාතික සංවර්ධනයේ දී කේන්ද්‍රීය භූමිකාවකට ජීවය දිය හැකි ඉහළ නිපුණතාවක් සහ පරිපූර්ණත්වයක් මෙන්ම  අද්විතීය ගුණාත්මකභාවයක් සහිත අත්‍යවශ්‍ය මානව සම්පත් තොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රය තුළ නිපදවීම.

## ක්ෂණික යොමුව

ලියාපදිංචි කාර්යාලය
තැ.පෙ. 1698, කොළඹ 03.
www.nilis.cmb.ac.lk

දුරකථන අංක

| | |
|---|---|
| පොදු | : +94-11-250 7150 |
| අධ්‍යක්ෂ | : +94-11-250 7148 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | : +94-11-3443 793 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | : +94-11-344 3634 |

ෆැක්ස් අංක : +94-11-2507150

ඊ මේල් : director@nilis.cmb.ac.lk

## අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) 1999 දී කොළඹ විශ්වවිද්‍යාලය යටතේ පිහිටුවන ලද්දේ ලෝක බැංකු ආධාර ලද සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියෙහි සංරචකයක් ලෙසය. එමගින් මෙරට පාසල් පුස්තකාල 2000 ක් අලුතින් ඉදිකරන ලද අතර තවත් පාසල් පුස්තකාල 2000 ක් ප්‍රතිසංස්කරණය කෙරිණි. NILIS හි ප්‍රධාන කාර්යභාරය වූයේ මෙම පුස්තකාලවලට අලුතින් බඳවා ගන්නා ලද ගුරුපුස්තකාලයාධිපතින් සහ සහායක කාර්යමණ්ඩලය මෙන්ම වෙනත් පුස්තකාලවල කාර්යමණ්ඩල සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීමය. මේ අනුව NILIS ගුරුපුස්තකාලයාධිපතීන් සඳහා ගුරුපුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ද සහායක කාර්ය මණ්ඩල සඳහා පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා ද ආරම්භ කරන ලදී. මෙයට අමතරව ජාතික ආයතනයක් වශයෙන් NILIS කොළඹ මෙන්ම රටපුරා පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල මෙන්ම පාසල් මට්ටමින්ද කෙටි කාලීන පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. මේ සියලු පාඨමාලා සැලසුම් කර ඇත්තේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ ලෝක මට්ටමින් සිදු වෙමින් පවතින සංකල්පීය වෙනස්කම් හා පරිවර්තනයන්ට අනුකූලවන ආකාරයටය. මේ නිසා සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලාවලදී වැඩි වශයෙන් ප්‍රායෝගික කුසලතා වෙත අවධානය යොමු කර ඇති අතර පශ්චාත් උපාධි පාඨමාලාවලදී න්‍යායික කරුණු සාකච්ඡා කෙරේ.

## NILIS සුවිශේෂත්වය

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලද්දේ පුස්තකාල ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටය. එහෙත් ආයතනය ප්‍රධාන වශයෙන් පාසල් පුස්තකාල ක්ෂේත්‍රය වෙත අවධානය යොමු කර ඇත. එයට හේතුව මෙම ආයතනයේ ආරම්භය ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද පාසල් පුස්තකාල සංවර්ධනය ව්‍යාපෘතියට සම්බන්ධ වීමය. එහෙයින් පාසල් පුස්තකාලවල භෞතික සම්පත් සංවර්ධනයට සමගාමීව එහි කාර්යමණ්ඩලවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පාඨමාලා ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා තොරතුරුවිද්‍යා පාඨමාලා පවත්වන තවත් ආයතන තිබේ. කැළණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ඊට නිදසුන් වේ. NILIS පාඨමාලා ඉහත පාඨමාලාවලට වඩා වෙනස් වන්නේ ඒවා වැඩි වශයෙන් න්‍යායික ක්‍රියාකාරකම්වලට වඩා ප්‍රායෝගික අංශයට නැඹුරු වීම නිසාය. එහෙයින් NILIS පාඨමාලාවල දේශනවලට වඩා දේශන ශාලාවෙන් පරිබාහිරව සිදු කෙරෙන ක්‍රියාකාරකම්වලට අවධානයක් යොමු කර ඇත.

**අනාගත සැලසුම්**

NILIS හි ප්‍රධාන අරමුණ වන්නේ පුස්තකාල ක්ෂේත්‍රයේ මානව සම්පත දියුණු තලයකට ගෙන ඒමය. ආයතනය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමට නව උපායමාර්ගයක් අනුගමනය කිරීමට සැලසුම් කෙරිණි. ඒ අනුව 2016 වර්ෂයේදී පළාත් මට්ටමින් පාසල් පුස්තකාලවලට අදාළ පාඨමාලා පැවැත්වීමට මෙම වසරේදී කටයුතු සම්පාදනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඌව පළාත තුළ ප්‍රථමයෙන් පාසල් පුස්තකාලයාධිපතිත්ය පිළිබඳ ඩිප්ලෝමා (DSL) සහ සහතිකපත්‍ර (CSL) පාඨමාලා පැවැත්වීමට අදාළව ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වා එකඟතාවයකට පැමිණ ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ මානව සම්පත නව අධ්‍යාපනික සංකල්පවලට අනුව සංවර්ධනය කිරීම සඳහා වඩාත් පුළුල් මැදිහත්වීමක් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංකල්පීය සහ ප්‍රායෝගික පරිවර්ථනයට අවශ්‍ය ශාස්ත්‍රීය නායකත්වය සැපයීමට හැකි වීම ගැන අපි නිහතමානීව සතුටු වෙමු.

අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

**කළමනාකරණ මණ්ඩලය**
**2015 ජූනි 11 දින දක්වා**

මහාචාර්ය රංජිත් සේනාරත්න මයා, උප සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (නිල බලයෙන්)

ප්‍රසන්න රණවීර මයා, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිල බලයෙන්)

මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස මයා, පීඨාධිපති, අධ්‍යාපන පීඨය (නිල බලයෙන්)

මහාචාර්ය ජී.එන්.වික්‍රමනායක මයා, අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල වි.වි.ප්‍ර.කො.ස.නියෝජිත

මහාචාර්ය රසල් බෝඩින් මයා, වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය, පුස්තකාලයාධිකාරි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

බී.එම්.එස්.බණ්ඩාර මිය, අධ්‍යක්ෂ/ සංවර්ධන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත (නිල බලයෙන්)

ගීතා විමලවීර මිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශ නියෝජිත

ශිවන්ති වීරසිංහ මිය, සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (නිල බලයෙන්)

එල්.ඒ.ජයතිස්ස මයා, පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

ඩබ්ලිව්. සුනිල් මයා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (නිල බලයෙන්)

ජී.ආර්.පද්මසිරි මයා, පුස්තකාලයාධිකාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

**2015 ජූනි 12 දින සිට**

වෛද්‍ය රුවයිස් හනීෆා මයා, සභාපති, SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත (නිල බලයෙන්)

ප්‍රසන්න රණවීර මයා, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිල බලයෙන්)

මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස මයා, පීඨාධිපති, අධ්‍යාපන පීඨය (නිල බලයෙන්)

මහාචාර්ය ජී.එන්.වික්‍රමනායක මයා, අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල වි.වි.ප්‍ර.කො.ස.නියෝජිත

මහාචාර්ය රසල් බෝඩින් මයා, වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මයා, පුස්තකාලයාධිකාරි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

එච්.ඩී.එස්.එන්.හෙට්ටිගේ මයා, සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත (නිල බලයෙන්)

ගීතා විමලවීර මිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශ නියෝජිත

ශිවන්ති වීරසිංහ මිය, සභාපති/ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (නිල බලයෙන්)

එල්.ඒ.ජයතිස්ස මයා, පුස්තකාලයාධිපති, කැලණිය විශ්වවිද්‍යාලය SCOLIS/ වි.වි.ප්‍ර.කො.ස. නියෝජිත

ආචාර්ය නයනා විජයසුන්දර මිය, පුස්තකාලයාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වි.වි.ප්‍ර.කො.ස. නියෝජිත

ඩබ්ලිව්. සුනිල් මයා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (නිල බලයෙන්)

## කාර්ය මණ්ඩලය

| සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | සටහන් |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 | - | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | - | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 01 | 01 | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 03 | 03 | - | - |
| සහකාර පුස්තකාලයාධිපති | 01 | 01 | - | - |
| පරිගණක යෙදවුම් සහකාර (III ශ්‍රේණිය) | 04 | 02 | 02 | තිදෙනෙකු දෛනික ගෙවීම් පදනම මත සේවය කරයි |
| ලිපිකරු (I ශ්‍රේණිය) | 01 | 01 | - | - |
| පොත් තබන්නා (III ශ්‍රේණිය - B) | 01 | 01 | - | - |
| පුස්තකාල සහකාර (III ශ්‍රේණිය) | 02 | 01 | 01 | |
| රියදුරු (II ශ්‍රේණිය) | 01 | 01 | - | - |

## මානව සම්පත් සංවර්ධනය

NILIS ආයතනය දර්ශනපති /ආචාර්ය උපාධි මට්ටමේ සිට සහතිකපත්‍ර මට්ටම දක්වා පාඨමාලා පවත්වනු ලබයි.

**දර්ශනපති/ ආචාර්ය උපාධි (MPhil/PhD) වැඩසටහන්**

NILIS හි පෙර වර්ෂවදී ලියාපදිංචි වූ සිසුන් පස්දෙනෙක් තම අධ්‍යයන කටයුතුවල නිරත වන අතර 2014 වර්ෂයේදී සිසුන් 05 දෙනෙකු අලුතින් ලියාපදිංචි වූහ. පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 01 වගුවේ දැක්වේ.

**<u>ශාස්ත්‍රපති වැඩසටහන්</u>**

NILIS ආයතනයෙහි පහත සඳහන් ශාස්ත්‍රපති වැඩසටහන් ක්‍රියාත්මක වේ.

- තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති පාඨමාලාව (MIM)
- පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS)
- ගුරු පුස්තකාලයාධිපතිත්ව ශාස්ත්‍රපති පාඨමාලාව (MTL)

තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MIM) පාඨමාලාව සඳහා 2013/2014 අධ්‍යයන වර්ෂයේදී ලියාපදිංචි වූ සිසුන්ගෙන් සිසුන් තිදෙනෙක් තම නිබන්ධයේ කටයුතුවල නිරතවෙමින් සිටින අතර (පර්යේෂණ මාතෘකා 02 වගුවේ දැක්වේ) 2015/2017 සඳහා සිසුන් 09 ලියාපදිංචි වී ඇත.

පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS) පාඨමාලාව සඳහා 2014 වර්ෂයේදී ලියාපදිංචි වූ සිසුන් 05ක් තම පර්යේෂණ නිබන්ධයේ කටයුතුවල නිරත වූහ. (පර්යේෂණ මාතෘකා 03 වගුවේ දැක්වේ)

2015/2017කණ්ඩායම සඳහා සිසුන් 10 දෙනෙක් ලියාපදිංචි වී ඇති අතර ඔවුන් තම පාඨමාලා කටයුතුවල නිරත වේ.

ගුරුපුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MTL) සඳහා 2014/15 කණ්ඩායම (පූර්ණ කාලීන) සඳහා සිසුන් 06 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර ඔවුන් තම අධ්‍යයන කටයුතුවල නිරතවෙමින් සිටී.

**<u>පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා</u>**

NILIS ආයතනයේ පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලබයි.

- පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGLIS)
- තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDIM)
- ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGTL)

පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ 2015/2017 සඳහා ලියාපදිංචි වූ සිසුන් 15 දෙනෙකු ලියාපදිංචි වූහ. මෙයට අමතරව මෙම පාඨමාලා සඳහා 2014/2015 දී ලියාපදිංචි වූ සිසුන් 06 දෙනෙකු තම නිබන්ධයේ කටයුතුවල නිරත වූහ. (පර්යේෂණ මාතෘකා 4 වගුවේ දැක්වේ)

තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2014/2015 සිසුන් කණ්ඩායමෙහි සිසුන් ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කිරීමේ කාර්යයෙහි නියැලුනහ. (පර්යේෂණ මාතෘකා 5 වගුවේ දැක්වේ) 2015/2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 11 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2014/2015 කණ්ඩායමේ සිසු සිසුවියන් 05 ක් පර්යේෂණ නිබන්ධයේ කටයුතුවල නියැලුනහ. (පර්යේෂණ මාතෘකා 6 වන වගුවේ දැක්වේ)

**<u>ඩිප්ලෝමා පාඨමාලා</u>**

NILIS ආයතනය පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

- පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (DLIM)
- පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL)
- මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DPL)

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව වසර 03 ක පාඨමාලාවක් වන අතර එහි පළමු වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතිකපත්‍ර පාඨමාලාව (PILIM) ලෙසද දෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර්මධ්‍ය පාඨමාලාව (ILIM) ලෙසද තෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (DLIM) ලෙසද පැවැත්වේ. මේ අනුව පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතිකපත්‍ර පාඨමාලාව සඳහා 2015 වර්ෂයේදී සිසුන් 14 දෙනෙකු ලියාපදිංචි වී ඇති ඇත.

පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා (DSL) පාඨමාලාවේ 2014/15 සිසු කණ්ඩායම 2015 දී පාඨමාලාව සම්පූර්ණ කළ අතර 2015 දී මෙම පාඨමාලාව සඳහා සිසුන් 42 දෙනෙකු බඳවා ගැනිණි.

මහජන පුස්කතාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016 කණ්ඩායම සඳහා සිසුන් 14 දෙනෙකු ලියාපදිංචි වූහ.

<u>සහතික පත්‍ර පාඨමාලා</u>

NILIS ආයතනය පහත සඳහන් සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි.

- පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL)
- මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL)
- ඉංග්‍රීසි සහ තොරතුරු සාක්ෂර කුසලතා සහතික පත්‍ර පාඨමාලාව.

පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2015 දී සිසුන් 30 දෙනෙකු ද මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 11 දෙනෙකු ද මෙම වසරේදී ලියාපදිංචි වී ඇත.

උසස් පෙළ විභාගය නිම කළ සිසුන් සඳහා ඉලක්ක කර ආරම්භ කරන ලද ඉංග්‍රීසි භාෂාව සහ තොරතුරු සාක්ෂර කුසලතා සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 27 දෙනෙකු ලියාපදිංචි වූහ.

<u>කෙටිකාලීන පාඨමාලා</u>

මෙරට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය තුළ දියුණු මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විවිධ කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මේ අනුව කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණය යන මැයෙන් 26.03.2015 සිට 21.05.2015 දක්වා ද 15.10.2015 සිට 03.12.2015 දක්වා ද වශයෙන් පුහුණු වැඩසටහන් දෙකක් මෙම වර්ෂය තුළ දී පවත්වන ලද අතර ඊට සහභාගී වූ පිරිස 46 කි. මෙම පුහුණු වැඩසටහනෙහි සම්පත්දායකයන් වශයෙන් NILIS ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් මෙන්ම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සහ කළමනාකරණ පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ද පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ද කටයුතු කළහ.

දර්ශනපති/දර්ශනසූරි උපාධි හදාරණ සිසුන් සඳහා සම්මන්ත්‍රණයක් 14.11.2015 දින පැවැත්වූ අතර ඒ සඳහා සිසුන් 38 දෙනෙකු සහභාගී විය.

යාපනය පුස්තකාලයේ කාර්යමණ්ඩලය සඳහා පැවැත්වූ තොරතුරු සාක්ෂරතාව තෙදින වැඩමුළුව සඳහා 48 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූහ. පුස්තකාලයාධිපතීන් සඳහා වන ජාත්‍යන්තර වැඩමුළුවක් 2015 වර්ෂයේ පැවැත්විණි. ඒ සඳහා 31 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූහ.

## උපාධි ප්‍රදානෝත්සවය

2015 වර්ෂයේ දී පැවති කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී ශාස්ත්‍රපති උපාධිධාරීන් දෙදෙනෙක් (2) ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා උපාධිධාරීන් 33 දෙනෙක් ද උපාධි ලබා ගත්හ.

## බාහිර කථිකාචාර්ය මණ්ඩලය

NILIS ආයතනයේ ස්ථිර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිටිනුයේ තිදෙනෙක් පමණක් බැවින් පාඨමාලාවල දේශන කටයුතු සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනේ.

ඒ අනුව පහත සඳහන් විද්වතුන් ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවල දේශකයන් වශයෙන් සහභාගී වී ඇත.

මහාචාර්ය පියදාස රණසිංහ, කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ගාමිණී ද අල්විස්, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඩිල්ජිත් සිං, මලයා විශ්වවිද්‍යාලය, මැලේසියාව

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න, පුස්තකාලයාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ආචාර්ය ඩී.කේ.ඩී. ජයකොඩි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න, හිටපු අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

හැරිසන් පෙරේරා මයා, හිටපු පුස්තකාලයාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ජී.ආර්. පද්මසිරි මයා, පුස්තකාලයාධිකාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

එල්.ඒ. ජයතිස්ස මයා, පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය

එම්.එන්. රවිකුමාර් මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, නැගෙනහිර විශ්වවිද්‍යාලය

එල්.එම්. උදය ප්‍රසාද් කබ්රාල් මයා, ලේඛන සංරක්ෂක , ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ටී. රමනන් මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, නැගෙනහිර විශ්වවිද්‍යාලය

හර්ෂ බාලසූරිය මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පී.කේ.සී.එම්. විජේවික්‍රම මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, සබරගමුව විශ්වවිද්‍යාලය

ජේ.එම්.පී.පී. ජයසිංහ මිය, කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය

ජී.ජේ.ගුණවර්ධන මිය, ඉංජිනේරු-පාරිභෝගික නිෂ්පාදන අලෙවිකරණය, ශ්‍රී ලංකා ටෙලිකොම්

ඩී.එම්.පී. බණ්ඩාරනායක මිය, පුස්තකාල අධ්‍යක්ෂ, ඇමරිකානු තොරතුරු මධ්‍යස්ථානය

ටී. ප්‍රතීපන් මයා, සහකාර පුස්තකාලයාධිකාරී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

බුද්ධින් කුමාර මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය

මනෝජා සමරදිවාකර මිය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්දන විජේකෝන් මයා, කථිකාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

## NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ

NILIS පර්යේෂණ සම්මන්ත්‍රණය 2015 නොවැම්බර් 13 දින කොළඹ විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී. මේ සඳහා සැසිවාර 4 ක් සහ තේමා හතරක් යටතේ පර්යේෂණ පත්‍රිකා 13 ක් ඉදිරිපත් කෙරිණි. ප්‍රජාව සහ ව්‍යාප්ති සේවා, තොරතුරු පර්යේෂණ සහ ප්‍රකාශන, වර්ධිත තාක්ෂණික සේවා සමඟ ප්‍රවේශය දියුණු කිරීම සහ පාඨක අධ්‍යයන යනාදිය එකී තේමාවන් වේ. මෙයට අමතරව විවිධ තේමා යටතේ පෝස්ටර් සැසියක්ද පැවැත්විණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ ආර්ථික කාර්යක්ෂමතාවට බලපාන තොරතුරු පරතරයන් පිළිබඳ අධ්‍යයනයක්
**පර්ල් කේ.විජේසේකර සහ ජගත් රාජපක්ෂ**

මොරටුව විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ ව්‍යාපෘති ක්‍රියාකාරකමක් ලෙස තොරතුරු කුසලතා දියුණු කිරීමට තාක්ෂණික සිසුන් වෙත යොමු වීම.
**තුෂාරි එම්. සෙනෙවිරත්න, උපේක්ෂා කොඩිතුවක්කු, කේ.ජී.ඒ.පී.කිරිඇල්ල**

ඊළඟ පරම්පරාවේ සම්පත් අනාවරණ මෙවලම ක්‍රියාත්මක කිරීම වෙතට: ශ්‍රී ලංකාවේ ඩිජිටල් තැන්පතුවල ඒකාබද්ධ සූචිය
**ජයකාන්තන් මාරියාපිල්ලෙයි සහ රුවන් ගමගේ**

සමීක්ෂණ පර්යේෂණ සැලැස්ම ආදර්ශකරණය: ආධුනික සමීක්ෂකයන් සඳහා ඵලදායීකරණය වෙනුවෙන් මූලික සැලසුම් අවධි පිළිබඳ විමසුමක්
**වත්මානෙල් සෙනෙවිරත්න**

ශාස්ත්‍රීය ප්‍රකාශනය සහ කතුවරුන් මුහුණ දෙන අභියෝග
**චතුරංග වීරසේකර**

යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පර්යේ ෂණ එකුව පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක්
**යූ.ලතා සහ එස්.අම්බිහායි**

උපාධි අපේක්ෂකයන් විසින් භාවිත කරන තොරතුරු මූලාශ්‍ර යොදා ගැනීම: දෘෂ්‍ය සහ ප්‍රසංග කලා විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්ගේ නිබන්ධ පිළිබඳ උපහරණ විශ්ලේෂණයක්
**ඒ.වී.එම්.කේ.අංකුඹුර**

පුස්තකාල කළමණාකරණය සඳහා නිදහසු මූලාශ්‍ර යොදා ගැනීම: ගැටලු සහ අභියෝග
**සී.ඩී.එන්.පුංචිහේවා සහ ඒ.ඩී.බී.කුමාර**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම සහ පිළිගැනීම
**ජී.ඩී.එම්.එන්.සමරදිවාකර සහ චන්ද්‍රා ගුණවර්ධන**

ආපසු භාර නොදීම නිසා අස්ථානගත වන පොත්: ශාස්ත්‍රීය පුස්තකාලයක් ඇසුරින් සිද්ධි අධ්‍යනයක්
**ශිරාණි රණවීර**

දෘෂ්‍ය කලා උපාධි අපේක්ෂකයන්ගේ පැවරුම්වල විශ්ලේෂණ කුසලතා භාවිතය: ස්වාමි විවේකානන්ද සෞන්දර්ය ආයතනය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්.
**බී.ප්‍රශාන්තන්**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දැනුම කළමනාකරණය සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම
**එස්.එල්.සියත් අහමඩ්, වත්මානෙල් සෙනෙවිරත්න, ලයනල් අමරකෝන්**

## පහත සඳහන් මාතෘකා යටතේ පෝස්ටර් 13ක් ඉදිරිපත් කෙරිණි.

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වෘත්තීයවේදීන් අතර රැකියා තෘප්තිමත්භාවයෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස.
**එම්.පී.එල්.ආර්.මාරසිංහ, අනුෂා විජේරත්න**

කොහා, ලිබ්සිස් ඇලිස් නො වින්ඩෝස් සුචිකරණ මොඩියුල පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යනයක්.
**ජී.ඩී.ඒ.එස්.මල්කාන්ති, නිමල් හෙට්ටිආරච්චි**

ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිති සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පුස්තකාල පාඨකයන්ගේ තොරතුරු ගවේෂණ චර්යාව.
**එම්.ඩී.ආර්.කුමුදුනී**

හමුදා නිලධාරීන්ගේ පුස්තකාල භාවිතය පිළිබඳ ඇගයීමක්.
**ආර්.එම්.ආර්.දියලගෙදර**

යාපනය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පුස්තකාල පාඨක සමීක්ෂණයක්.
**කිරුපා හෝලි**

සිසුන් විසින් ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්පත් ඒකකය භාවිතා කිරීම: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ඇසුරින් සිද්ධි අධ්‍යයනයක්.
**ටිනේෂා නානායක්කාර**

ශිෂ්‍ය සාධනය සඳහා ජාලගත ඉගෙනුමෙහි බලපෑම පිළිබඳ අධ්‍යයනයක්.
**අසිත සඳරුවන් ජයසූරිය**

සිංහරාජ වන සංරක්ෂිතය පිළිබඳ සැසඳීමක්. Trip Advisor විමසුම්: අන්තර්ගත විශ්ලේෂණයක්
**පී.කේ.ජයසේකර, එම්.එස්.එම්.එල්.කරුණාරත්න**

ශ්‍රී ලංකාවේ පුස්තකාල ප්‍රභවය සහ පරිණාමය
**එස්.ආර්.එස්.උදේශි, ඒ.එම්.සී.එම්.අධිකාරි, ඩබ්.ඒ.ස්වර්ණකාන්ති, ජී.ඩබ්.පී.කුරුප්පු, එස්.ආර්.බී.කේ.ඩී.සී.කඩදර, ජී.ආර්.එස්.ජයකොඩි, ඒ.පී.ඉලංගකෝන්**

රජයේ සහ පෞද්ගලික අංශයේ සංවිධාන අතර විද්‍යුත් පාසල් ප්‍රත්පත්ති පිළිබඳ සැසඳීමක්.
**ඉනෝකා පීරිස්, ප්‍රීතිකා වීරසිංහ, විදූෂි ද කොස්තා, දිනූෂි වීරකෝන්, චතුරංග ජයවීර, මහින්ද අමරසිරි**
සාමාජීක වෙබ් පරිශීලික නිර්ණායකවලට අනුව ඉංග්‍රීසි වාර්තාගත පුවත්පත් පහක් පිළිබඳ විවේචනාත්මක ඇගයීමක්.
**කිෂෝලි මෙන්ඩිස්, යශෝධා ධර්මවර්ධන, රසිකා තුෂාන්ත, ෂෆ්කාන් හමාස්, සමන්ත ලියනගේ**

ශ්‍රී ලංකාවේ තොරාගත් පුස්තකාලයන්හි තාක්ෂණික පිරිසැකසුම් ක්‍රියාවලිය භෞතික අංග පිළිබඳ ඡායාරූපමය ඉදිරිපත් කිරීමක්.
**ඩී.පී.සී.විතාන, එස්.වීරසිංහ, එෆ්.ඉසෙඩ්.අෂීක්, වී.අලගරත්නම්, අයි.ශ්‍රීමාලිනී, පී.ලෝෂිනී, එන්.රුජානි, එච්.පී.ද සිල්වා, ආර්.එස්.විතාන, පී.කේ.විජේසේකර**

පුස්තකාල ද්‍රව්‍ය තෝරා ගැනීමේ ක්‍රියාවලියෙහි දී භාවිත තෝරා ගැනීම් මෙවලම්.
**විජිත් ජයසිංහ, සමන්ත කරුණාරත්න, හර්ෂනී අතුකෝරල, ලිහිණි මාරම්බේ, දිල්මිනී මෙත්තසිංහ, වසන්ත විජේරත්න, කේ.ඒ.ඒ.ඩී.ඩී.සංජීවනී**

## බාහිර අයතන සඳහා සම්පත් දායකත්වය

<u>ආචාර්ය රුවන් ගමගේ / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය</u>

2015.02.27 - සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ වැඩමුළුව
2015.04.08- සහ 30, 2015.05.07, 2015.11.12, 19 සහ 26, ගූගල් ඇප්ස් සහ ලේඛන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන (පරිගණක යෙදවුම් සහකාරවරයන් සඳහා)
2015.04.29 - ක්ලවුඩ් ඇල් සහ සමාජ මාධ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන (පරමාණු තාක්ෂණ ආයතනයේ සිසුන් සඳහා)
2015.05.12- පරිපාලකවන් සඳහා ගූගල් ඇප්ස් පිළිබඳ පුහුණු වැඩසටහන (රජරට විශ්වවිද්‍යාලය)
2015.07.17- පුස්තකාලයාධිපතින් සඳහා සමාජ මාධ්‍ය පිළිබඳ පුහුණු වැඩසටහන (රජයේ පුස්තකාලයාධිපතින් සඳහා)
2015.10.106, 13, 23 - ඒකාබද්ධ සුචිය පිළිබඳ පුහුණු වැඩසටහන (පුස්තකාලයාධිපතින් සඳහා)

<u>උදිත අලහකෝන්/ සහකාර පුස්තකාලයාධිපති</u>

- ❖ 2015.02.27 සහ 28 යන දිනයන්හි මාතලේ අධ්‍යාපන කලාපයේ පාසල් පුස්තකාලයාධිපතින් සඳහා පැවති වැඩමුළුවෙහි සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
- ❖ 2015.04.04 දින අම්පාර දිස්ත්‍රික්යේ පැවති පාසල් පුස්තකාලයාධිපති සහ මහජන පුස්තකාලයාධිපතින් සඳහා වූ වැඩමුළුවෙහි සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
- ❖ 2015.10.22-23 දිනයන්හි ත්‍රිකුණාමලය දිස්ත්‍රික්තයේ පාසල් පුස්තකාලයාධිපති සහ මහජන පුස්තකාලයාධිපතින් සඳහා වූ වැඩමුළුවේ සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
- ❖ 2015.11.16-17 දින හම්බන්තොට දිස්ත්‍රික්තයේ පාසල් පුස්තකාලයාධිපති සහ මහජන පුස්තකාලයාධිපතින් සඳහා වූ වැඩමුළුවේ සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
- ❖ 2015.03.09 දින අම්පාර දිස්ත්‍රික්තයේ පාසල් පුස්තකාලයාධිපතින් සහ මහජන පුස්තකාලයාධිපතින් සඳහා වූ වැඩමුළුවෙහි සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.
- ❖ 2015.09.28 දින පැවති මහජන පුස්තකාලයාධිපතින් සඳහා වූ සුචිකරණ වැඩමුළුවෙහි සම්පත් දායකයෙකු වශයෙන් ක්‍රියා කිරීම.

**පී.ජී.ප්‍රේමදාස මහතා/ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

මධ්‍යම පළාත විසින් සංවිධානය කරන ලද කෙටි කාලීන පාඨමාලාවන්හි සම්පත් දායකත්වය සැපයීම

| | | |
|---|---|---|
| 2015.08.23 | - | අවශ්‍යතා විශ්ලේෂණය |
| 2015.04.06 | - | පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ කාර්යභාරය |
| 2015.09.10 | - | තොරතුරු කුසලතා ඉගැන්වීම් |
| 2015.09.11 | - | තොරතුරු කුසලතා ඉගැන්වීම් |
| 2015.09.17 | - | සහභාගීත්ව ඉගෙනුම |
| 2015.09.18 | - | සහභාගීත්ව ඉගෙනුම |
| 2015.10.08 | - | ඉගෙනුමේ දිගුව |
| 2015.10.09 | - | ඉගෙනුමේ දිගුව |
| 2015.11.02 | - | කියවීම ඉගැන්වීම |
| 2015.11.03 | - | ළමා හා යොවුන් සාහිත්‍යයට අදාළ ඉගැන්වීම් |
| 2015.11.30 | - | ගුරු/පාසල් පුස්තකාලයාධිපති පර්යේෂකයෙකු ලෙස ක්‍රියාත්මක විය යුතු ආකාරය |
| 2015.12.01 | - | ඇගයීම හා වාචික ඉදිරිපත් කිරීම |

## අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ දායකත්වය

### ප්‍රකාශන

**ආර්.පී.පී.රණවීර මහතා /අධ්‍යක්ෂ**

❖ සිසුන්ගේ කියවීම, ලිවීම සහ සන්නිවේදන කුසලතා වර්ධනයට ශ්‍රී ලංකීය ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා NILIS පශ්චාත් උපාධි පාඨමාලා කෙතෙක් දුරට උපකාරී වී ඇත්ද, සාරාංශය සහ පෝස්ටර් ඉදිරිපත්කිරීම, අන්තර්ජාතික පුස්තකාල සංගම් සම්මන්ත්‍රණය 2015 ජූනි 28 ජූලි 03, මාස්ට්‍රිඩ්, නෙදර්ලන්තය

**ආචාර්ය රුවන් ගමගේ /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

❖ ඊලඟ පරම්පරාවේ සම්පත් අනාවරණ මෙවලමක් වෙතට: ශ්‍රී ලංකාවේ ඩිජිටල් තැන්පතුවල අතවශ්‍ය ඒකාබද්ධ සුචිය

**උදිත අලකෝන් /සහකාර පුස්තකාලයාධිපති**

ස්ලැවොජ් ජිජැක් : රූපමය නියමුවක්
ජෝන් බ්‍රෝදිලාද්: රූපමය නියමුවක්
අමරිකානු මුසල්මානුවා
අනුරාගී

## බාහිර ආයතනවල කමිටු සාමාජිකත්වය

<u>ආර්.පී.පී.රණවීර මහතා /අධ්‍යක්ෂ</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යාපන අංශයේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

<u>ආචාර්ය රුවන් ගමගේ /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

- ❖ ජාතික විද්‍යා පදනමේ ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ අධීක්ෂණ කමිටු සාමාජිකයෙකු වීම

<u>උදිත අලහකෝන් / සහකාර පුස්තකාලයාධිපති</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික සාධිකාරී ලේඛන (කර්තෘ, ග්‍රන්ථනාම සහ ආයතන) සම්පාදන කමිටුවල සාමාජිකත්වය දැරීම.
- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති සම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වීම.
- ❖ කොළඹ මහජන පුස්තකලයේ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු වීම.

## 1. පාඨමාලාවන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | සිසුන්ගේ මුළු එකතුව | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව |
|---|---|---|---|
| දර්ශනපති/දර්ශනශූරි | 10 | බා.05<br>ස්.02 | 01 |
| පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව- පූර්ණ කාලීන | 17 | බා.11<br>ස්.02 | 01 |
| තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව - පූර්ණ කාලීන | 14 | බා.10<br>ස්.01 | 01 |
| ගුරු පුස්තකාලයාධිපතිත්ව උපාධි පාඨමාලාව –පූර්ණ කාලීන | 06 | බා.08<br>ස්.02 | 01 |
| තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - අර්ධ කාලීන | 13 | බා.05<br>ස්.02 | 01 |
| ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - පූර්ණ කාලීන | 05 | බා.10<br>ස්.01 | 01 |
| පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව - අර්ධ කාලීන | 21 | බා.04<br>ස්.01 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව | 42 | බා.08<br>ස්. 01 | 01 |
| මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව | 14 | බා.02<br>ස්.01 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | 14 | බා.2<br>ස්. 03 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව | 14 | බා. 8<br>ස්.3 | 01 |
| මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව | 11 | බා.7<br>ස්.04 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව | 30 | බා. 10<br>ස්.03 | 01 |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (සිංහල මාධ්‍ය) | 66 | ස්.03 | 01 |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (ඉංග්‍රීසි මාධ්‍ය) | 18 | ස්.03 | 01 |

* ස්. ස්ථිර කථිකාචාර්යවරුන්

* බා. බාහිර කථිකාචාර්යවරුන්

## 2. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

- **අධ්‍යක්ෂ - ආර්.පී.පී.රණවීර මහතා (2014.02.23 සිට)**

| විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උප දේශක | විෂය |
|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන විද්‍යාව | ඉංග්‍රීසි/සිංහල | | | පී.ජී.ප්‍රේමදාස මයා | | - | - | - |
| පුස්තකාල විද්‍යාව | ඉංග්‍රීසි/සිංහල | | | ආර්.පී.පී.රණවීර මයා | | - | - | - |
| තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි/සිංහල | | | ආචාර්ය රුවන් ගමගේ මයා | | - | - | - |
| සහකාර පුස්තකාලයාධිපති යූ.පී.අලහකෝන් මයා | | | | | | | | |

## 3. පරිපාලන කාර්යය මණ්ඩලයේ විස්තර

| අංශය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් |
|---|---|---|---|
| පරිපාලන | ඒ.අබේරත්න මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | ඒ.එන්.එල්.නාමලී මිය,<br>ලිපිකරු II ශ්‍රේණිය<br>එන්.කේ.කුරුප්පුආරච්චි මයා<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br><br>ටී.එච්.ආර්.බී.චන්ද්‍රතිලක මිය<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය | ඒ.ඒ.ජේ.අබේසිංහ මයා<br>රියදුරු |
| මූල්‍යය | එච්.වී.එස්.එම්.ජයසේකර මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | එස්.ඒ.ඩී.ටී.එන්.රත්නායක මයා<br>පොත් තබන්නා II ශ්‍රේණිය | |
| පුස්තකාල | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති | බී.පී.වෙත්තසිංහ මිය<br>පුස්තකාල සහකාර III ශ්‍රේණිය | |

## 4. පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රකාශිත | **Commercialized** | ප්‍රකාශිත |
|---|---|---|---|
| (අ) පර්යේෂණ සංඛ්‍යාව | 02 | | පර්යේෂණ නිබන්ධන සහ ව්‍යාපෘති වාර්තා 29 |
| (ආ) පොත් සංඛ්‍යාව | 04 | | |
| (ඇ) වෙනත් | | | |
| එකතුව | 06 | | 29 |

## 5.

**I.** වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | | **සම්පූර්ණ කරන ලද** | **දැනට පවතින** |
|---|---|---|---|
| a. පශ්චාත් උපාධි පාඨමාලා ගණන<br>දර්ශනපති/දර්ශනශූරී 02,තොරතුරු කළමනාකරණ 01 පුස්තකාල හා විඥාපන විද්‍යා 02, ගුරුපුස්තකාලයාධිපති (පූර්ණ කාලීන) 01, ගුරුපුස්තකාලයාධිපති (අර්ධ කාලීන) | 08 | 02 | 06 |
| b. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ගණන | 07 | 03 | 04 |
| c. උපාධි පාඨමාලා ගණන | - | - | - |
| d. ඩිප්ලෝමා පාඨමලා ගණන | 06 | 04 | 02 |
| e. සහතිකපත්‍ර පාඨමාලා ගණන | 11 | 06 | 05 |
| f. වෙනත්<br>වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 25 | 25 | - |
| එකතුව | 57 | 40 | 17 |

## ii. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | පාඨමාලා ලාභීන් ගණන |
|---|---|
| කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව (26.03.2015-21.05.2015) | 20 |
| කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව (15.10.2015-03.12.2015) | 26 |
| NILIS සම්මන්ත්‍රණය 2014 (13.11.2015) | 144 |
| MPhil/PhD සම්මේලනය (14.11.2015) | 38 |
| පුස්තකාලයාධිපති සඳහා ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | 31 |
| යාපනය විශවවිද්‍යාලයේ පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා තොරතුරු සාහිතයා පිළිබඳ තුන්දින වැඩමුළුව | 48 |
| NILIS බාහිර කථිකාචාර්යමණ්ඩලය සඳහා වූ තුන්දින පුහුණු වැඩමුළුව | 11 |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් | |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , දෙනුවර අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , මාතලේ අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , මහනුවර අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , කටුගස්තොට අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නුවරඑළිය අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නුවරඑළිය අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , හැටන් අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , කොත්මලේ අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගම්පල අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වපලනේ අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වලපනේ අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , නාඋල අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , වැලිගමුව අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගලේවෙල අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , හඟුරන්කෙත අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , තෙල්දෙණිය අධ්‍යාපන කලාපය | 40 |
| විදුහල්පතිවරුන් සහ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩසටහන , ගම්පල/කොත්මලේ අධ්‍යාපන කලාපය | 40 |

## 1 වගුව - දර්ශනපති ආචාර්ය /උපාධි

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 1 | ටී.එච්.කේ.ටී සිල්වා මයා | 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මගින් ලංකාවේ ප්‍රකාශන අයිතිවාසිකම් ක්ෂෙත්‍රයට ඇති වූ බලපෑම | ආචාර්ය තිස්ස හේමරත්න මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණු විශ්වවිද්‍යාලය |
| 2 | කේ.එම්.ඒ.එස්.ජයසූරිය මයා | පාසල් විෂය මාලාව සඳහා තොරතුරු සාක්ෂරතා විෂය මාලාවක ව්‍යුහික අවශ්‍යතාවය අධ්‍යයනය කිරීම | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 3 | එල්.එම්.යූ.ප්‍රසාද් කබ්රාල් මයා | A Study on the Biology and Ecology of the Invertebrate Fauna Associated with the Documents in Depository Libraries in Sri Lanka with a view of Developing Techniques for Conservation of Documents | Dr. Pascal Querner<br>Institute of Zoology, University of Natural Resources and Life Sciences, Vienna<br><br>මහාචාර්ය එන්.නුගලියද්ද මයා<br>කෘෂි අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය |
| 4 | ඒ.එස්.එම්.අසාහිම් මයා | Quality evaluation of private university libraries in Baharain using libQual model: An empirical study | ආචාර්ය නිෂාඩ් අන්වාස් මයා<br>සහකාර මහාචාර්ය,<br>Assistant Professor College of Business Administration, Kingdom University, Kingdom of Baharain |
| 5 | එන්.එම්.කරන්නාගොඩ මයා | Information Gathering (seeking) Behavior And In-House Library Usage for Academic Purposes of Undergraduates in the Universities of Sri Lanka. | ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය,<br>පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |

## 2 වගුව - තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MIM)
## පූර්ණ කාලීන

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | එස්.එල්.එස්.අහමඩ් මයා | Retaining the knowledge on the legislative process of the staff in the legislative department of the Sri Lankan parliament | ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය, පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 02 | එල්.ආර්.අමරකෝන් මයා | Explorative study on the low use of social media by university libraries in Sri Lanka: with special reference to Facebook. | තුෂාරි සෙනවිරත්න මිය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, මොරටුව විශ්වවිද්‍යාලය |
| 03 | එච්.සී.කරුණාසේකර මිය | Bibliometric analysis on postgraduate dissertations submitted to the Postgraduate Institute of Medicine | යූ.පී. අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 04 | එච්.අයි.එස්.පෙරේරා මිය | Effectiveness of information flow in supporting strategic decision making at the People’s Bank of Sri Lanka. | ගයාත්‍රි ගුණවර්ධන මිය, ව්‍යාපෘති සංවර්ධන කළමනාකරු/ඉංජිනේරු, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය |
| 05 | කමනි පෙරේරා මිය | An evaluation of the use of the library blog by the membership: A case study at the Regional Centre For Strategic Studies, Colombo | ආචාර්ය රුවන් ගමගේ මයා,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 06 | එල්.කේ.වේරගල මිය | Evaluation of usage of e-resources for writing dissertations in Postgraduate Institute of Medicine, Sri Lanka | ආර්.පී.පී.රණවීර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |

## 3 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS)

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 1 | ඒ.සී අබේවර්ධන | Running an efficient library service – main determinants from the users perspective: A case study based on the Postgraduate Institute of Management (PIM) Library | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ.ජයකොඩි මයා,<br>අධ්‍යක්ෂ, මානව සම්පත් අභිවර්ධන ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 2 | ඩබ්ලිව්.එච්.ඩී.කේ.අබේරත්න මිය | Enhancing self-directed Learning in Higher Education: Case Study at the Faculty of Agriculture, University of Peradeniya, Sri Lanka. | ආචාර්ය ටී.එම්.එස්.එස්.කේ.යටිගම්මන මිය<br>අධ්‍යාපන අධ්‍යනාංශය, ශාස්ත්‍ර පීඨය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 3 | ඩබ්ලිව්.අයෝනි පෙරේරා මිය | Assessing Information Literacy Competencies of the design undergraduates in "Academy of Design", Sri Lanka | ප්‍රසන්න රණවීර මයා<br>අධ්‍යක්ෂ<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| 4 | පී.කේ.ජයසේකර මහත්මිය | Influence of Social Media in the choice of a tourist destination; The case of tourists opting to visit Sinharaja Forest, Sri Lanka | ***Main Supervisor***<br>මහාචාර්ය ඔස්කා අමරසිංහ මයා<br>කෘෂි අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය<br>***Co-supervisor***<br>එච්.අයි.ජී.සී.කුමාර මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව හා සමාජවිද්‍යා අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය |
| 5 | පී.ජී.නිශාන්ත මහතා | "A comparison of citation behavior between traditional and social media' | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 4 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGLIS)

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | එච්.ඩබ්.එන්.බොතේජු මිය | **ප්‍රබන්ධ කෘති කියවීම සිසුන්ගේ ඉගෙනුම් සාධනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ස්ටැෆර්ඩ් ජාත්‍යන්තර පාසලේ 9 ශ්‍රේණියේ සිසුන් ඇසුරින්)** | යූ.පී. අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 02 | ඒ.ලේකම්හේවා මිය | An Action Research on using Google Search engine effectively by teachers in Ladies College, Colombo | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | පී.ඩී.මනම්පේරි මයා | **ඇමෙරිකානු මධ්‍යස්ථාන පුස්තකාලයට පැමිණෙන ශ්‍රී ලාංකිය පුරවැසියන්ගේ තොරතුරු අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක්** | එච්.එම්.ඩී.සංජීවනී මිය,<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 04 | එම්.පී.ජේ.රෝස්මරී මිය | **ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ගුරු සිසුන් තම පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අන්තර්ජාලය භාවිත කිරීම පිළිබඳ අධ්‍යයනයක් (ශ්‍රීපාද අධ්‍යාපන විද්‍යා පීඨයේ දෙවන වසර ප්‍රාථමික සිසුන් ඇසුරින්)** | යූ.පී.අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 05 | එම්.ඒ.එම්.ෆාරි මිය | Action Research on Developing Reading Skills of Primary School Students (Based on Grade 4 Students in Al Humaisara National School) | යූ.පී.අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 06 | එල්.ඒ.ආර්.සුනේත්‍රා මිය | A Study on Information Seeking Behavior of the Research Scholars of Fisheries and Aquatic Rssources Special Reference of National Aquatic Resources Research Development Agency (NARA) Research.Scholors | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 07 | එස්.එල්.එම්.හසන් මයා | Action Research on Improving Internet literacy among the Stndents in Jamiah Naleemiah Institute, Beruwala | තුෂාරි සෙනවිරත්න මිය,<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>මොරටුව විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| 08 | පී.එල්.යූ.ජයරත්න මයා | **ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විචාරාත්මක ඇගයීමක්** | යූ.පී.අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 09 | කේ.ඒතසී.පී.අබයගුණවර්ධන මයා | **විශ්වවිද්‍යාල සිසුවියන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යයනාංශ පුස්තකාලවල කාර්ය භාරය පිළිබඳ ඇගයීමක් (කොළඹ විශ්වවිද්‍යාලය ඇසුරින්)** | ප්‍රසන්න රණවීර මයා<br>අධ්‍යක්ෂ<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| 10 | ඒ.කේ.ඩී.එස්.ජයවික්‍රම මිය | **විශ්වවිද්‍යාල සිසුවියන්ගේ ලිංගික සබඳතා කෙරෙහි අන්තර්ජාලයෙන් වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්** | යූ.පී.අලහකෝන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 5 වගුව - තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGDIM)

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | ශිරෝමා බෙනරගම මිය | A Study on Use & IELTS Collection at the British Council Library (March – September 2016). | ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය, පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 02 | කේ.ඊ. විජේසූරිය මිය | Assessment of the Use of Information Communication Technology (ICT) as a Tool in the Teaching Process in Sri Lanka (Case Study based on Colombo South Provincial Education Area) | යූ.පී. අලහකෝන් මයා, සහකාර පුස්තකාලයාධිපති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | එච්.ඒ.පී. කුලතුංග මිය | An Action Research About Using internet as a Tool to Improve Student Achievement Based on Grade 12 Students of Sangabodhi College, Nittambuwa. | යූ.පී. අලහකෝන් මයා, සහකාර පුස්තකාලයාධිපති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 04 | එම්.එස්.එම්. ෂිහාම් මහතා | Comparative Study on National Library Web Sites in the SARC Region with a Special Focus on the Sri Lanka National Library Web Site. | හර්ෂ බාලසූරිය මයා සහකාර පුස්තකාලයාධිපති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |

## 6 වගුව - ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGTL) (පූර්ණ කාලීන)

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 1. | කේ.එල්.ඩබ්ලිව්. සමන්ති මිය | **ස්වාධීන ඉගෙනුම සඳහා පාසල් සිසුන්ගේ මුද්‍රිත මාධ්‍ය තොරතුරු ගවේෂණ චර්යා පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්**<br>**(බප/හෝ/සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලය ඇසුරින්)** | යූ.පී. අලහකොන් මයා,<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 2. | එම්.ජේ.සී. හේමලතා මිය | **පරිසර අධ්‍යයන විෂය සාධනය සඳහා ඉ-තක්සලාව යොදා ගැනීම පිළිබඳ කාර්ය මූලික පර්යේෂණයක්**<br>**(බප/කැල/රෝමානු කතෝලික ප්‍රාථමික විද්‍යාලයේ 4 ශ්‍රේණිය ඇසුරින්)** | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. | කේ.වී.එන්.ඩී. කරුණාසේන මිය | **සිතියම් කියවීමේ කුසලතාව වර්ධනය කිරීම සඳහා Google map යොදා ගැනීම පිළිබඳ කාර්ය මූලික පර්යේෂණයක්**<br>**(ර/පාතගම මහා විද්‍යාලයේ 6 ශ්‍රේණියේ සිසුන් ඇසුරින්)** | පී.ජී.ප්‍රේමදාස මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 4. | පී.කේ. චන්ද්‍රසේකර මිය | **අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් පුස්තකාලවල ක්‍රියාත්මක කිරීමට නිර්දේශිත වැඩසටහන් කියවීම් ප්‍රවර්ධනය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ විමසුමක්**<br>**(කොළඹ අධ්‍යාපන කලාපය ඇසුරෙන්)** | අසිත සඳරුවන් ජයසූරිය මයා,<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, බදුල්ල |

## පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | **2014Rs.** | **2015Rs.** |
|---|---|---|
| පෞද්ගලික සංවේතන | 13,671,862.00 | 14,821,160.00 |
| ගමන් | 18,729.00 | 2,376.00 |
| සැපයුම් | 703,985.00 | 713,130.00 |
| නඩත්තු | 592,686.00 | 1,150,642.00 |
| ගිවිසුම් සේවා | 1,352,992.00 | 1,350,658.00 |
| වෙනත් | 1,539,431.00 | 2,272,443.00 |
| එකතුව | 17,879,685.00 | 20,310,409.00 |

## ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | **2014Rs.** | **2015Rs.** |
|---|---|---|
| 1. ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ පවරා ගැනීම | 962,502.00 | 424,821.00 |
| 2. යන්ත්‍ර පවරා ගැනීම | 1,162,051.00 | 59,217.00 |
| 3. ගොඩනැගිලි ව්‍යුහය පවරා ගැනීම | 179,082.00 | 588,772.21 |
| 4. වෙනත් | 496,693.00 | 113,707.00 |
| එකතුව | 2,800,328.00 | 1,186,517.21 |

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය**

**2015-12-31 දිනට ශේෂ පත්‍රය**

| | සටහන් | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු | රු |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් | 04 | 7,270,719 | 3,622,578 |
| ලැබිය යුතු ආදායම් | 05 | 1,449,846 | 1,818,189 |
| බඩු තොග | | 163,329 | 158,603 |
| පෙර ගෙවුම් | 06 | 83,010 | 63,711 |
| අනෙකුත් ජංගම වත්කම් | 07 | 3,408,762 | 3,696,194 |
| | | **12,375,666** | **9,359,275** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 3 | 79,756 | 86,000 |
| යන්ත්‍ර හා පිරියත | 3 | 4,842,846 | 6,026,174 |
| ඉඩම් හා ගොඩනැගිලි | 3 | | - |
| | | **4,922,602** | **6,112,174** |
| **මුළු වත්කම්** | | **17,298,268** | **15,471,449** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වගකීම් | 08 | 522,327 | 529,357 |
| කෙටි කාලීන වෙන් කිරීම් | 09 | 3,749,337 | 4,082,475 |
| | | **4,271,664** | **4,611,832** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික | 2 | 2,531,151 | 2,961,471 |
| | | **2,531,151** | **2,961,471** |
| **මුළු වගකීම්** | | **6,802,815** | **7,573,303** |
| **ශුද්ධ වත්කම්** | | **10,495,453** | **7,898,146** |
| | | | |
| **ශුද්ධ වත්කම්/කොටස්** | | | |
| **ප්‍රග්ධන දායකත්වය** | | | |
| අනෙකුත් රජයේ ආයතන | 10 | 38,095,460 | 35,393,223 |
| සමුච්චිත අතිරික්තය/ඌනතාවය | 11 | (27,600,007) | (27,495,077) |
| **මුළු ශුද්ධ වත්කම්** | | **10,495,453** | **7,898,146** |

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය**

**2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම**

| | සටහන් | 2015 | 2014 |
|---|---|---|---|
| | | රු | රු |
| **ආදායම්** | | | |
| බදු | | | |
| පාඨමාලා ආදායම | 12 | 4,523,073 | 4,902,904 |
| පුනරුත්ථාපන හා නඩත්තු ප්‍රතිපාදන | | 588,772 | 179,082 |
| රජයේ ප්‍රතිපාදන | 13 | 15,000,000 | 12,000,000 |
| ශ්‍රම ප්‍රාග්ධන සංවර්ධන ප්‍රතිපාදන | 13 | 878,991 | - |
| වෙනත් ආදායම් | 14 | 1,262,039 | 1,308,697 |
| **මුළු ආදායම්** | | **22,252,875** | **18,390,683** |
| **වියදම්** | | | |
| වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ | 15 | 14,821,160 | 13,621,004 |
| සැපයුම් හා අනෙකුත් පරිභෝජන | 01 | 713,130 | 703,985 |
| ක්ෂය කිරීම් | 03 | 1,802,512 | 1,379,599 |
| අනෙකුත් වියදම් | 16 | 4,776,479 | 3,649,263 |
| මූල්‍ය පිරිවැය | 01 | 124,744 | 22,140 |
| KEID ව්‍යාපෘති වියදම් | | - | - |
| **මුළු වියදම්** | | **22,238,025** | **19,375,991** |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය/ඌනතාවය** | | **14,850** | **(985,308)** |

**ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය**

**2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2015 | **2014** |
|---|---|---|
| | රු | රු |
| **මෙහෙයුම් කටයුතු වලින් ලැබූ අරමුදල්** | | |
| අතිරික්තය/(ඌනතාවය) | 14,850 | (985,307) |
| **මූල්‍ය නොවන හුවමාරුවන්** | | |
| වර්ෂයේ ක්ෂය කිරිම් | 1,802,512 | 1,379,599 |
| ගෙවිය යුතු වියදම් වල අඩුවීම | (340,168) | 1,221,109 |
| ජංගම වත්කම් වල වැඩිවීම | 631,750 | (766,957) |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරිම් | 212,830 | 920,941 |
| පෙර වර්ෂ ක්ෂය වෙන්කිරීම් අඩුකිරීම් | (15,195) | 1,121,814 |
| ඉඩම් හා ගොඩනැගිලි මාරු කිරීම් | - | 677,800 |
| KEID ව්‍යාපෘති මාරු කිරීම් | - | (275,000) |
| ප්‍රාග්ධනිත ඉඩම් හා ගොඩනැගිලි මාරු කිරීම් | - | (398,147) |
| පාරිතෝෂික ගෙවීම් | (643,150) | (267,105) |
| **මෙහෙයුම් කටයුතු වලින් ලැබූ ශුද්ධ අරමුදල්** | **1,663,429** | **2,628,747** |
| **ආයෝජන කටයුතු වලින් ලැබූ අරමුදල්** | | |
| ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් | (597,744) | (2,728,746) |
| ශ්‍රම ප්‍රාග්ධන සංවර්ධන සඳහා ප්‍රතිපාදන | (878,991) | - |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය | (588,772) | (179,080) |
| **ආයෝජන කටයුතු වල යෙද වූ ශුද්ධ අරමුදල්** | **(2,065,507)** | **(2,907,826)** |
| **මූල්‍ය කටයුතු වලින් ලැබූ අරමුදල්** | | |
| **පෙර වර්ෂ ගැලපුම්** | **(119,780)** | **(928,781)** |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 4,170,000 | 2,700,000 |
| **මූල්‍ය කටයුතු වලින් ලැබූ ශුද්ධ අරමුදල්** | **4,050,220** | **1,771,219** |
| **මුදල් හා සමාන වන දෑ වල ශුදධ වැඩිවීම** | **3,648,142** | **1,492,140** |

**සටහන් අංක 07**

වෙනත් ජංගම වත්කම්

| | | 2016 (රුපියල්) | 2015 (රුපියල්) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | | 2,700,000 | 2,700,000 |
| සිසුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ආදායම් | 19 | 3,317,950 | 708,762 |
| | | **6,017,950** | **3,408,762** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඩියු/බී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/15
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2016 දෙසැම්බර් [illegible] දින

අධ්‍යක්ෂ

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2016 අගෝස්තු 01 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම නිසා පිරිවැය රු.22,286,717 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අබලි භාණ්ඩ ලෙස 2011 හා 2014 වර්ෂවලදී හඳුනාගත් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පරිගණක හා උපාංග 06 ක පිරිවැය වූ රු. 472,340 ක් හා ක්ෂය වෙන්කිරීම් දෙවතාවක් ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ලිබඩු හා කාර්යාල උපකරණ සහ පරිගණක හා මුද්‍රණ යන්ත්‍රවලට අදාළ පිරිවැය හා ක්ෂය අගයන් උපලේඛන සමඟ සැසැඳීමේදී පිළිවෙලින් රු.458,907 ක හා රු. 558,376 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු. 18,372,855 ක් වූ ජර්නල් වවුචර්වලට අදාල උපයෝගී ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ අවශ්‍යතා සපුරාලන පරිදි මෘදුකාංග සම්බන්ධ ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 2014 ඔක්තෝබර් 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2014 (V) හා (VI) ඡේද | 2015 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චි කළ නොහැකි ලෙස හඳුනාගත් ගත් ස්ථාවර වත්කම් 25 ක් ඇතුළු භාණ්ඩ 35 ක් ඉවත්කිරීම සම්බන්ධයෙන් කටයුතු අවසන් කර 2016 මාර්තු 17 දිනට පෙර එම වාර්තා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය. | 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සැපයුම්කරුවන් 9 දෙනෙකු වෙත ගෙවා තිබූ රු.118,438 ක් වූ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,850 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.985,307 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,000,157 ක වර්ධනයක් සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ වැටුප් හා වේතන ඇතුලු සේවක ප්‍රතිලාභ හා අනිකුත් වියදම් රු.2,327,372 කින් වර්ධනය වී තිබු නමුත් රාජ්‍ය ආයතනවලින් ලද මුදල් හා පුනරාවර්තන ප්‍රදාන රු.3,409,690 ක් වර්ධනය වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ඌනතාවයක් පැවති නමුත් 2015 වර්ෂයේ දී අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැළැකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ රු.7,922,814 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.16,425,692 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය 2(GEP–2) (1994-2002) යටතේ පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා බඳවාගත් පුස්තකාලාධිපතීන් හා එම පාසල්වල ගුරු පුස්තකාලාධිපතීන් සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීම ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ අරමුණ වේ.

පාඨමාලා පැවැත්වීම සම්බන්ධ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගුරු පුස්තකාලාධිපතිවරුන්ගේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ගුරු පුස්තකාලාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) යන අදාල සුදුසුකම් ඇතුළත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබු නමුත් ගුරු සේවා ව්‍යවස්ථාවට එය ඇතුළත් නොකිරීම හේතුවෙන් එම පාඨමාලාව සඳහා ඉල්ලුම අවම වී තිබුණි.

(ආ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 4 (අ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව පාඨමාලා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හා ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි , අභිඥාන පත්‍ර, සහතික පත්‍ර , හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීමේ දී කොමිෂන් සභාවේ එකඟත්වය ලබාගත යුතු වුවත් එලෙස අනුමැතිය ලබා නොගෙන 2003 ආරම්භක වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා වසර 13 කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා වාර 39 ක්ද, ඩිප්ලෝමා පාඨමාලා වාර 18 ක්ද, සහතික පත්‍ර පාඨමාලා වාර 34 ක්ද , වශයෙන් පාඨමාලා වාර 91 ක් පවත්වාගෙන යමින් තිබුණි.

(ඇ) ආයතනය පාඨමාලා පැවැත්වූ වාර ගණනින් සියයට 37ක්ම සහතික පත්‍ර පාඨමාලා වීමෙන් හා 2015 වර්ෂයට ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන් සියයට 42 ක් සහතික පත්‍ර පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන් වීමෙන් ආයතනය කෙටිකාලීන පාඨමාලාවලට වැඩි දායකත්වයක් ලබාදී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දක්වා වසරක කාලය තුළ පැවැත්වූ පාඨමාලා සඳහා සහභාගි වූ මුළු සිසුන් ගණන 293 ක් වූ නමුත් සහතිකපත් ලබාදී තිබුණේ සිසුන් 56 දෙනෙකු සඳහා පමණි.

(ඉ) 2007 හා 2011 වර්ෂයන් හිදි ආරම්භ කරන ලද දර්ශනපති/ දර්ශන ශූරී 2007/2010 හා 2011/2014 තුන් අවුරුදු පාඨමාලා ආරම්භකර 2015 වර්ෂය වන විට පිළිවෙලින් වසර 9 ක් හා වසර 5 ක් ගතවී ඇතත් පාඨමාලාව අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS – FT) පාඨමාලාව 2013/2015 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන් 4 දෙනාගෙන් එක් අයෙකු පමණක් පාඨමාලාව අවසන් කර සහතිකපත් ලබාගෙන තිබුණි.

(උ) 1991 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 12(6) වගන්තිය යටතේ 2015 වර්ෂයේදී ශාස්ත්‍රීය කමිටු රැස්වීම් වාර 9 ක් පවත්වා තිබූ අතර නියමාවලියේ 12 (1) (ඈ) සහ (ඉ) වගන්ති යටතේ කමිටු සාමාජිකයන් කමිටු රැස්වීම් සඳහා සහභාගීවීම පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පනත යටතේ පිහිටුවනු ලැබූවා වූ හෝ පිහිටුවන ලදැයි සළකනු ලබන්නා වූ විශ්වවිද්‍යාලවල එක් එක් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ ප්‍රධානියා නියමාවලියේ 12(1) ඇ වගන්තිය යටතේ නම්කරනු ලැබ තිබුණද වර්ෂය තුළදී කිසිදු කමිටු රැස්වීම් වාරයක් සඳහා හෝ සහභාගී වී නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමයේ නියෝජිතයකු නියමාවලියේ 12(1) (ඉ) වගන්තිය යටතේ නම්කරනු ලැබ තිබුණද වර්ෂය තුළදී එක් කමිටු රැස්වීම් වාරයක් සඳහා පමණක් සහභාගීවී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ සහ බඩු වට්ටෝරු පොත්වල පරිගණක හා පරිගණක උපාංග වෙන වෙනම හඳුනාගත හැකි පරිදි දක්වා නොතිබීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව 2015 දෙසැම්බර් 31 දිනට දක්වන භෞතික ශේෂය සමඟ සැසඳීමට නොහැකි විය.

(ආ) 2014 සැප්තැම්බර් මස රු.107,500 ක් වටිනා ගිණුම්කරණ පැකේජයක් ගිණුම්කරණ කටයුතු පහසු වීම සඳහා මිලදීගෙන තිබුණි. නමුත් ආයතනයේ අවශ්‍යතාවය නිසිලෙස හඳුනානොගෙන පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම හේතුවෙන් ජර්නල් සටහන් පරිගණක මෘදුකාංග පද්ධතිය හරහා මුද්‍රණය කිරීමේදී බොහොමයක් ජර්නල් සටහන්වල එකතුව නිවැරදි නොවීම,හර හා බැර ශේෂ අසමාන වීම, අසම්පූර්ණ වී මුද්‍රණය වීම ආදී දෝෂ නිරීක්ෂණය විය. මේ හේතුවෙන් මෘදුකාංග පද්ධතිය තුළින් බලාපොරොත්තු වූ කාර්ය ඉටුවී නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා පරිගණක උපාංගවල පිරිවැය හඳුනාගත නොහැකිවීම. |
| | (ii) | පරිගණක උපාංගයක් අපහරණය කිරීමේදී ඒ සමග දැනට භාවිතා කරන එම පරිගණකවල අනෙකුත් උපාංග සියල්ලම ඉවත්කිරීම. |
| | (iii) | ස්ථාවර වත්කම් ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම. |
| (ආ) ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු පාලනය | (i) | පුස්තකාල තැන්පතු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| | (ii) | ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු ලේඛනයේ හා උපලේඛනයේ තැන්පතු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| | (iii) | ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු උප ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

NILIS

National Institute of

Library and Information Sciences
University of Colombo, P.O. Box 1698 Colombo 03, Sri Lanka
Tele /Fax: +94-11-2507150, e-mail: director@nilis.cmb.ac.lk, Web: www.nilis.cmb.ac.lk

මගේ අංකය NILIS/35/2/15

20.03.2017

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 72/306
පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

අප වෙත ලැබී ඇති ඊඩීයූ/බී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/15 දරන විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අප ආයතනයේ අදහස් හා පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

**මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

මෙම ස්ථාවර වත්කම් වල,ක්ෂය අනුපාතය නැවත විමර්ෂනය කර කළමණාකරන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අභ්‍යාන්තර කමිටුවක නිර්දේශය මත,දැනට ක්ෂය කර ඇති අගය,ගිණුම් වලින් ගැලපීමට 2017 වර්ෂය තුළදී කටයුතු කරනු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

2016 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කර ඇත.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස් කම්**

නිවැරදි කර ඇත.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සෑම ජ'නල් වවුචරයක් සඳහාම උපයෝගි ලේඛනයක් අමුණා ඇත.එසේ නොමැති සෑම අවස්ථාවකදීම ජ'නල් වවුචරයේ සංලක්ෂ්‍යයේ අදාළ ගණනය කිරීම් පැහැදිලිව සඳහන් කර ඇත.

**2.3 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

(අ) පරිගණක සඳහා පරිගණක ආශ්‍රයෙන් පිළියෙළ කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය **IAI/2002/02** ආකෘතියට අනුව පිළියෙළ කර ඇත. එම ලේඛනය පිළියෙළ කිරීමේදී අදාළ වන සෑම තොරතුරක්ම ඇතුලත් කර ඇත.මෙම ලේඛනයේ තවදුරටත් පවතින අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණයේදී පාවිච්චි කල නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගත් ස්ථාවර වත්කම් 25ක් ඇතුළු භාණ්ඩ 35ක් අබලි භාණ්ඩ ඉවත් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර එම භාණ්ඩ සම්බන්ධ තක්සේරු වාර්තාව නියමිත වෙලාවට ලැබීම ප්‍රමාද වීමෙන් ද, ඇතැම් කමිටු සාමාජික මහත්ම මහත්මීන් අදාළ කාලය තුළ නිවාඩු ලබා සිටීම හේතුවෙන් ද එම වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. අදාළ දින වකවානු පහත පරිදි වෙයි.

| | |
|---|---|
| **අබලි භාණ්ඩ ඉවත් කිරීමේ කමිටුව විසින් එම කමිටු සාමාජික මහත්ම මහත්මීන්ගේ නිර්දේශ සහ නිගමනයන් ලබා දීම** | 12/02/16 |
| **සහකාර ලේඛකාධිකාරිනිය ගේ ස්වාමි පුරුෂයා ගේ අභාවය හේතුවෙන් ඇය සේවයට වාර්තා කිරීම ප්‍රමාද වූ බැවින් ද, අධ්‍යක්ෂවරයා රටින් බැහැරව සිටි බැවින් ද අධ්‍යක්ෂවරයා ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ දිනය** | 10/03/16 |
| **අධ්‍යක්ෂවරයා ගේ අනුමැතිය ලද දිනය** | 30/03/16 |
| **කළමණාකරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමැතියද ලබා ගැනීම** | 08/04/16 |
| තක්සේරු කමිටුව හමුවට ඉදිරිපත් කිරීම | 18/04/16 |
| තක්සේරු වාර්තාව | 30/05/16 |
| **තක්සේරු වටිනාකම සඳහන් ලිපිය සමග භාණ්ඩ වෙන්දේසි කිරීමට අධ්‍යක්ෂවරයා ගේ අනුමැතිය** | 06/06/16 |
| වෙන්දේසි දිනය | 22/06/16 |

**ඉදිරියේදී එම වාර්තා නියමිත වේලාවට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.**

(ඇ) 2015 සැප්තැම්බර් මස සිට මෙම වාර්තාව අදාළ පාර්ශව වෙත යැවීම ආරම්භ කර ඇත.එබැවින් 2015 සැප්තැම්බර් මාසයට පෙර කාල පරිච්ඡේදයට අයත් වවුචර් 07ක් සහ අතපසුවීමකින් 2015 සැප්තැම්බර් මාසයට පසුව වවුචර් 02කුත් වශයෙන් වවුචර් 09ක් සම්බන්ධ තොරතුරු අදාළ පාර්ශව වෙත යැවීමට නොහැකි වී ඇත.දැනට අදාළ වාර්තා සෑම මසකම නියමිත දිනට පෙර මෙම වාර්තාව යැවීමට කටයුතු කර ඇත.

## 4.මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) මෙම කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර

ඇත. මේ සම්බන්ධව පසුගිය පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමක දී ද සාකච්ඡාවට භාජනය කරනලදී. එම අවස්ථාවේ පාර්ලිමේන්තු කාරක සභා සභාපතිවරයා පැවසුයේ මෙම ගැටලුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීම අවශ්‍ය බව යි. මෙම කරුණු සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යතුමා සහ ලේකම් තුමා ද හමුවී සාකච්ජා කරන ලද අතර අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් 2017 වසරේදී අත්සන් කිරීමටද සැලසුම් කර ඇත.

(ආ) ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ පවත්වනු ලබන පාඨමාලා සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 13.03.2017 සහ UGC/AC/SCOLIS/GEN/2017 දරණ ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇත.

(ඇ) 2003 වසරේ සිට විශේෂයෙන් පාසල් පුස්තකාල වල මධ්‍යම සහ පහළ ශ්‍රේණි සඳහා විශාල පිරිසක් බඳවා ගෙන ඇත. ඔවුන් මූලික වෘත්තීය සුදුසුකම් සපුරා නොතිබූ හෙයින් පසුගිය කාලය තුළ අප ආයතනයේ පවත්වන ලද ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය විය. ඒ අනුව අප එම ඉල්ලුම සපුරාලීමට කටයුතු කර ඇත. එම නිසා මෙරට පුස්තකාල ක්ෂේත්‍රයේ මානව සම්පත දියුණු කිරීම යන ආයතනයේ ඉලක්කයෙන් බැහැර වීමක් සිදු වී නොමැත. සිදු වී ඇත්තේ පශ්චාත් උපාධි පාඨමාලාවලට සාපේක්ෂව ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා සඳහා වැඩි පිරිසක් ඇතුළත්වීමය

(ඈ) පශ්චාත් උපාධි/ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන් බොහෝ දෙනකු තම ව්‍යාපෘති වාර්තාව හෝ උපාධි නිබන්ධනය අදාළ කාලය තුළ භාර නොදීම බොහෝ ආයතනවල පාඨමාලාවල දක්නට ලැබෙන පොදු තත්ත්වයකි. පවුලේ සහ රැකියාවට අදාළ කාර්ය බහුලතාවය හා වෙනත් ගැටලු මීට හේතු විය හැකි ය. බොහෝ විට එවැනි සිසුහු ඉන් පසු වසර කිහිපය තුළ පාඨමාලාව සම්පූර්ණ කරති. ඔවුන් දිරිමත් කරමින්, නිරතුරුව සොයා බලමින්, පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා උනන්දු කරවීම අප ආයතනයේ කාර්ය මණ්ඩලය අතින් දෛනිකව සිදු වෙයි. තවද ආයතනයේ විශේෂ අවස්ථාවලදී (උදා: වාර්ෂික සම්මන්ත්‍රණය) ඔවුන් දැනුවත් කෙරෙන අතර ආයතනය වෙත රඳවා තබා ගැනීමට ද උත්සාහ කෙරේ

(ඉ) මෙම පාඨමාලා සඳහා මුලදී අයදුම් කළ ශිෂ්‍යයින්ගෙන් කොටසක් විවිධ හේතුන් නිසා පාඨමාලාව සම්පූර්ණ කර ගත නොහැකිව ඉවත් වී ඇත. MPhil/PhD 2011/2014 පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන් තවමත් ඔවුන්ගේ උපාධි නිබන්ධන සම්පූර්ණ කර නොමැති නිසා පාඨමාලාව අවසන් කිරීමට නොහැකි වී ඇත. එක් සිසුවියක් දර්ශනශූරී උපාධිය 2016 දෙසැම්බර් පැවති පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේ දී ලබාගෙන ඇත. තවත් සිසුවියක් දර්ශනපති උපාධිය ලැබීමට සුදුසුකම් ලබා ඇත.

(ඊ) 2013/2015 කණ්ඩායම සඳහා ලියාපදිංචි වූ සිසුන් 4 දෙනාගෙන් එක් අයෙකු පමණක් තම උපාධි නිබන්ධය භාර දීම හේතුවෙන් එම සිසුවාට පමණක් පාඨමාලාව සාර්ථක ලෙස නිම කළ අතර තවත් සිසුවෙකු පාඨමාලාව 2016 වර්ෂයේ සාර්ථකව නිම කරන ලදී. අනෙක් සිසුන් දෙදෙනා තම උපාධි නිබන්ධය සහ පැවරුම් භාර නොදීම හේතුවෙන් ඔවුන්ට පාඨමාලාව නිම කිරීමට නොහැකි විය.

(උ) එක් රැස්වීමක් සඳහා ප්‍රමාණවත් සාමාජික සංඛ්‍යාවක් නොපැමිණීම හේතුවෙන් රැස්වීම නොපවත්වන ලදී. 2016 වසරේ දී එම අඩුපාඩුව මග හැරවීමට පියවර ගෙන ඇත.

I. සියලු දැනුම් දීම් කර ඇතත් සහභාගි වී නැත.

II. සියලු දැනුම් දීම් කර ඇතත් අදාළ කාලය තුළ එක් රැස්වීමකට පමණක් සහභාගි වී තිබේ. ඉදිරියේ දී රැස්වීම සඳහා වෙනත් සාමාජිකයෙකු නම් කරන ලෙස අදාළ ආයතනයෙන් ඉල්ලීමට කටයුතු කරමි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) පරිගණක හා උපාංග වල වටිනාකම සැපයුම්කරු විසින් වෙන් වෙන් වශයෙන් ලබා නොදෙන බැවින් එම එක් එක් උපාංග වල වටිනාකම වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට නොහැකි වී ඇත.ඉදිරියේදී මිලදී ගනු ලබන පරිගණක හා උපාංග සඳහා පිරිවැය වෙන වෙනම නිර්ණය කර සටහන් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරනු ලැබේ.

(ආ) 2017 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී,ගිණුම් පැකේජය මඟින් ඍජුව ලබා ගන්නා ලද ජ'නල් සටහන් භාවිතා කරන ලදි.එබැවින්,දැනට මෙම ගැටළුව පැන නගින්නේ නැත.

**පද්ධති හා පාලනයන්**

(අ) (ආ) මෙහි සඳහන් ස්ථාවර වත්කම් ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම සහ පුස්තකාල තැන්පතු ලේඛනය සහ උපලේඛනය අතර ඇති වෙනස්කම් දැනට නිවැරදි කර ඇති අතර අනෙකුත් අඩුපාඩු කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඒවා නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.